# ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

## පුරප්පාඩු

මෙම විශ්වවිද්‍යාලයේ පුරප්පාඩුව පවතින පහත සඳහන් තනතුරු සඳහා නියමිත සුදුසුකම් සපුරා ඇති අයගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

### කොන්ත්‍රාත් පදනම මත විදුලි කාර්මික තනතුර

**සුදුසුකම් :**

(I). ලිවීමේ හා කියවීමේ හැකියාව.

(II). පහත සඳහන් කරුණු පිළිබඳ මනා දැනුමක් තිබීම.

(අ) දෝෂයන් සොයා ගැනීම, උපකරණ අළුත්වැඩියාව සහ එකලස් කිරීම, ට්‍රාන්ස්ෆෝමර් සහ සියළුම වර්ගවල යන්ත්‍රසූත්‍ර සහ උපකරණ, රැහැන්, වයර් සහ ඒවා වර්ග කිරීම, මිණුම් උපකරණ සහ ඒවායේ භාවිතය, රැහැන් ඇදීමේ විවිධ ක්‍රම, පිරිද්දුම්, මීටර් සහ කුඩා ට්‍රාන්ස්ෆෝමර් පරීක්‍ෂා කිරීම.

(ආ) රූප සටහන් කියවා තේරුම් ගැනීම, පරිමාණයන් කියවීම සහ භාගික මාන සටහන් තැබීම.

(ඇ) මෙම වෘත්තියට අදාල උපකරණ භාවිතය සහ ආරක්‍ෂාව.

(III). රජයේ දෙපාර්තමේන්තුවක, රාජ්‍ය සංස්ථාවක හෝ පිළිගත් ආයතනයක විදුලි කාර්මිකයෙකු වශයෙන් වසර දෙකකට (02) නොඅඩු පළපුරුද්දක් ලබා තිබීම.

### කොන්ත්‍රාත් පදනම මත ජලනල කාර්මික තනතුර

**සුදුසුකම් :**

(I). කියවීමේ හා ලිවීමේ හැකියාව.

(II). පහත සඳහන් කරුණු පිළිබඳ නිපුනත්වයක් ලබා තිබිය යුතුය.

(අ) අඟලෙන් 1/64 දක්වා පරිමාණයන් කියවීමට හැකියාව සහ ආයුධ නඩත්තු කිරීම හා ඒවා භාවිතා කරන ආකාරය.

(ආ) නොයෙකුත් පිරිද්දුම් ඇතුළත්ව C.I. , G.I සහ ඊයම් පයිප්ප එලීම සහ ඒවා පරීක්‍ෂා කිරීම.

(ඇ) බෝල වැල්වයන්, ජල භාජන ආදිය අලුත්වැඩියා කිරීම සහ සරල සටහන් කියවීමට හා තේරුම් ගැනීමට හැකියාව.

(III). ජලනල කර්මාන්තය පිළිබඳ අවුරුදු දෙකකට (02) නොඅඩු පළපුරුද්දක් තිබිය යුතුය.

**තෝරා ගැනීම** : වෘත්තීය පරීක්ෂණයක් හා සම්මුඛ පරීක්ෂණයක් මඟින්

**වැටුප** : රු. 50,000.00 (සියලු දීමනා ඇතුළත්)

**වයස** : අවුරුදු 55 ට නොවැඩි විය යුතුය.

**ප්‍රතිලාභ :** තෝරා ගන්නා අය සේවක අර්ථසාධක අරමුදලේ සාමාජිකයන් වන අතර ඔවුන්ගේ ස්ථාවර මාසික දීමනාවෙන් 8% ක ප්‍රමාණයක් සහ ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය විසින් 12% කට සමාන ප්‍රමාණයක් සේවක අර්ථසාධක අරමුදලට ගෙවනු ඇත. ඊට අමතරව ඔවුන්ගේ ස්ථාවර මාසික දීමනාවෙන් 3% කට සමාන ප්‍රමාණයක් ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය විසින් සේවා නියුක්තයන්ගේ භාර අරමුදලට ගෙවනු ඇත.

**අයදුම් කලයුතු ආකාරය :**

තමන් විසින් සකස් කරන ලද සවිස්තරාත්මක තොරතුරු ඇතුළත් අයදුම්පතක් සහතිකවල පිටපත් ද සමඟ ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී/අනධ්‍යයන ආයතන, ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය, නාවල, නුගේගොඩ යන ලිපිනයට 2024.07.30 දිනට පෙර ලැබෙන සේ තැපැල් මඟින් එවීමට හෝ පැමිණ භාරදීමට හැකිය. සහතිකවල පිටපත් සමඟ 2024.07.30 දිනට පෙර විශ්වවිද්‍යාලය වෙත ලැබෙන අයදුම්පත් පමණක් පරීක්ෂණය සඳහා සලකා බලනු ලැබේ.

**සැලකිය යුතුයි** : පුරප්පාඩු පවතින්නේ මෙම විශ්වවිද්‍යාලයේ නාවල පරිශ්‍රයේ පමණි.

ලේඛකාධිකාරී
ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය
නාවල, නුගේගොඩ

2024.07.17